සියලුම හිමිකම් ඇවුරිණි]
All Rights Reserved]

## සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව

## තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය (2020)

| | | |
|---|---|---|
| ව්‍යාපාර අධ්‍යයනය **II**<br>**Business Studies II** | **32 S II** | පැය තුනයි<br>**Three hours** |

**උපදෙස්**

- එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් හිමි වේ.

### I කොටස

01. (i) අ) ව්‍යාපාර භාණ්ඩ හුවමාරු ක්‍රමයේ සිට මුදල් භාවිතයට යොමු වීමට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න.

ආ) වුවමනා විවිධ වීමට හේතු මොනවාද?

(ii) පහත සඳහන් වන්නේ පුවත්පත්වල පලවූ ප්‍රවෘත්ති කිහිපයකි.

1. ඇමරිකන් ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය තවදුරටත් අවප්‍රමානය වේ.
2. ඉදිරි දිනවල තවදුරටත් වර්ෂාව වැඩි වියහැකි බව කාලගුණ විද්‍යා දෙපාර්තුමේන්තුව පවසයි.
3. ශ්‍රී ලංකාවේ ජනගහනය තුළ බෝනොවන රෝග සීග්‍රයෙන් ඉහලට.
4. සමාජීය වෙළෙඳපොළ ආර්ථික ක්‍රමය ශ්‍රී ලංකාවට වඩා ගැලපෙන බව රජය පවසයි.

ඉහත එක් එක් ප්‍රවෘත්තියට අදාළ සාර්ව පරිසර සාධකය කුමක්ද යි සඳහන් කරන්න.

(iii) මුදල් භාවිතයේ ඓතිහාසික විකාශනයේ අවස්ථා කෙටියෙන් විස්තර කරන්න.

(iv) අ) ව්‍යාපාරයකට අචාර ධර්ම පද්ධතියක් සකස් කර ගැනීමේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

ආ) සමාජ වගකීම් ඉටු කිරීමේ දී ව්‍යාපාර මුහුණ දෙන අභියෝග කවරේද?

(v) සරත් සිල්ලර වෙළෙඳසැලකින් එක්තරා විශේෂිත සන්නමක බිස්කට් වර්ගයක් ඉල්ලා සිටි විට වෙළෙන්දා විසින් වෙනත් වර්ගයක බිස්කට් පැකට්ටුවක් ලබා දී තිබුණි. එම බිස්කට් පැකට්ටුවේ ද ලේබලය වෙනස් කර ඇති බව පසුව හඳුනාගන්නා ලදී. සරත් විසින් මේ පිළිබඳව වෙළෙන්දාට පවසන ලද අතර වෙළෙන්දා විසින් ඒ පිළිබඳ අවධානය යොමු නොකරණ ලදී.

මෙම සිද්ධි තුළ ඍජුවම උල්ලංඝණය වී ඇති පාරිභෝගික අයිතිවාසිකම් නම් කර කෙටියෙන් විස්තර කරන්න.

**(ලකුණු 4×5=20)**

02. (i) “ශ්‍රී ලංකික පාරිභෝගිකයා නිරන්තර වෙළෙඳ විෂමාචාරවලට ගොදුරු වේ”. මේ තත්ත්වය පිටු දැකීමට වඩාත් ම සුදුසු විසඳුම යෝජනා කර එය සාධාරණීකරණය කරන්න.

(ii) ධනපාල රු. 250 000 ක මුදලක් සහ රු.175 000 ක් වටිනා සිය ඉඩම ප්‍රාග්ධනය වශයෙන් යොදවා පාවහන් නිපදවා අලෙවි කිරීමේ ව්‍යාපාරයක් මීට අවුරුදු දෙකකට පෙර ආරම්භ කරන ලදී. ඔහු සැපයුම්කරුවන්ගෙන් ණය පදනම මත පාවහන් මිලදී ගෙන අලෙවි කරනු ලබයි. කෙසේ නමුත් වර්තමානය වන විට වැරදි කළමනාකරණ තීරණ නිසා සැපයුම්කරුවන්ගේ ණය මුදල් ගෙවීමට නොහැකි තත්ත්වයක් උදා වී ඇත. ධනපාල සැපයුම්කරුවන්ට පවසා සිටියේ **ව්‍යාපාරය බුන්වත්** වී ඇති බැවින් ණය ගෙවිය නොහැකි බවයි.

ව්‍යාපාර අධ්‍යයනය හැදෑරූ ශිෂ්‍යයෙකු වශයෙන් මෙහි නීතිමය තත්ත්වය ධනපාලට පැහැදිලි කර දෙන්න.

(iii) අ) සීමා සහිත පොදු සමාගමක වාර්ෂික මහ සභා රැස්වීමක් පැවැත්වීමේ අවශ්‍යතාවය කෙටියෙන් පැහැදිලි කරන්න.

ආ) පොදු සමාගමක සාමාන්‍ය කොටස් හිමියෙකුට සාපේක්ෂව වරණීය කොටස් හිමියෙකු ලබන වරප්‍රසාද මොනවාද?

(iv) මැන්චෙස්ටර් සමුළු සංවිධානය පිළිගත් සමූපකාර ප්‍රතිපත්තියක් ලෙස **‘ප්‍රජාතන්ත්‍රවාදී පාලනය’** දැක්විය හැකි ය. සීමිත සමාගමක් හා සසඳමින් සමූපකාර සිමිතියක පාලනය වඩා ප්‍රජාතන්ත්‍රවාදී බව තහවුරු කරන්න.

(v) අ) ඇතැම් ව්‍යාපාර රාජ්‍ය හිමිකාරත්වය යටතේ පවත්වා ගැනීමට හේතු හතරක් සඳහන් කරන්න.

ආ) ව්‍යාපාර වර්ග කිරීමේ දී යොදාගනු ලබන නිර්ණායක හතරක් සඳහන් කරන්න.

**(ලකුණු 4×5=20)**

03. (i) ව්‍යවසායකත්වයේ **පුද්ගල ප්‍රතිලාභ** හා **සමාජ ආර්ථික** ප්‍රතිලාභ දෙක බැගින් සඳහන් කරන්න.

(ii) ලොව සෑම ව්‍යවසායකයෙක්ම වෙනස්කම් කරන නියෝජිතයෙකි. එවැනි ව්‍යවසායකයින් තුළ දැකිය හැකි ගුණාංග හතරක් පැහැදිලි කරන්න.

(iii) ආ) “නිමල් රු.1500 වටිනා කමිසයක් වෙළෙඳසැලකින් මිල දී ගත්තේ මගුල් ගෙදරකට සහභාගී වීමට ඇති නිසාය”. මෙම සිද්ධිය තුළ සඳහන් මුදලේ කාර්යයන් මොනවාද?

ආ) ශ්‍රී ලංකා මහ බැංකුව ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ දී කාසි හා නෝට්ටු වර්ග ගණනාවකින් නිකුත් කරන අතර විවිධ වර්ණ, ප්‍රමාණ, හැඩ අදිය භාවිත කරයි.

මෙම විස්තරය තුළ සඳහන් වන මුදලේ ගුණාංග පමණක් සඳහන් කරන්න.

(iv) ඉඩමක් මිල දී ගත් පුද්ගලයෙක් ඒ සඳහා චෙක්පතකින් මුදල් ගෙවීමට අපේක්ෂා කරයි. චෙක්පත පිළියෙළ කළ යුතු හොඳම ක්‍රමය රූප සටහනක් යොදා ගනිමින් පැහැදිලි කරන්න.

(v) අ) ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු මොනවාද?

ආ) මූල්‍ය යටිතල පහසුකම් යනු මොනවාදැයි නිදසුන් ඉදිරිපත් කරන්න.

**(ලකුණු 4×5=20)**

04. (i) රක්ෂණය හා ආරක්ෂණය අතර වෙනස්කම් මොනවාද?

(ii) වර්මානයේ අධිවේගී මාර්ග ඉදිකිරීමට යොමු වීමේ ප්‍රවනතාවයක් පෙන්නුම් කරයි. අධිවේගී මාර්ග ඉදිරිකිරීම තුළින් පමණක් ප්‍රවාහනයේ කාර්යක්ෂමතාවයක් අපේක්ෂා කළ හැකිද? විමසන්න.

(iii) අ) විද්‍යුත් සන්නිවේදන ක්‍රම කොතෙක් පැවතිය ද ලිඛිත සන්නිවේදන ක්‍රම භාවිතය ද විශාල වශයෙන් සිදු වේ. මෙසේ ලිඛිත සන්නිවේදන ක්‍රම භාවිතයට හේතු මොනවාද?

ආ) ශ්‍රී ලංකාවේ දුම්රිය ප්‍රවාහන ක්ෂේත්‍රයේ පවතින ගැටලු මොනවාද?

(iv) ශ්‍රී ලංකාවේ අපනයන වෙළෙඳාමේ සංයුතිය සහ දිශාව සුදුසු සංඛ්‍යා දත්ත භාවිතයෙන් විමසීමට ලක් කරන්න.

(v) භාණ්ඩ තොගයක් ආනයනය කර ගැනීමට අපේක්ෂා කරන ව්‍යාපාරිකයෙකු විසින් අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙළ කෙටියෙන් පැහැදිලි කරන්න.

**(ලකුණු 4×5=20)**

## II කොටස

05. (i) අ) ව්‍යාපාර කාර්යයන් හතරක් නම් කර ඊට අයත් කටයුතු දෙක බැගින් ලියන්න.

ආ) නිමි ඇඳුම් නිෂ්පාදන ව්‍යාපාරයක් යොදාගනු ඇතැයි සිතිය හැකි **භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය** සහ **තොරතුරු** යන සම්පත් සඳහා නිදසුන බැගින් සඳහන් කරන්න.

(ii) විශ්මිත නැමති තරුණ නව නිර්මාණකරුවා කොරෝනා වෛරසර විනාශ කළ හැකි විෂබීජානුහරණ උපකරණයක් නිර්මාණය කර ඇත.

අ) මෙම උපකරණය අනුකරණය කිරීම වැළැක්වීමට විශ්මිතට ලබාගත හැකි බලපත්‍රය කුමක් ද?

ආ) එම බලපත්‍රයේ වලංගු කාලය කොපමණද?

ඇ) එම බලපත්‍රය ලබාගත හැක්කේ කිනම් නීතියක් යටතේ කවර ආයතනයකින්ද?

(iii) තොරතුරු දැනගැනීමේ අයිතිය සහ පිළියම් ලබා ගැනීමේ අයිතිය තහවුරු කිරීම සඳහා ඇගළුම් ව්‍යාපාරිකයෙකුට ගත හැකි ක්‍රියාමාර්ග දෙක බැගින් ලියන්න.

(iv) කෙටියෙන් පැහැදිලි කරන්න.

අ) ISO 9001-2015 ආ) නීතිමය පුද්ගලභාවය

ඇ) ගුණාත්මක ණය පාලනය ඈ) 4 R සංකල්පය

(v) හවුල් ව්‍යාපාරවලට සාපේක්ෂව සමාගම් ක්‍රමයේ වාසි හතරක් සඳහන් කරන්න.

**(ලකුණු 4×5=20)**

**06.** (i) පහත දැක්වෙන ව්‍යාපාර ආයතන සංයෝජනය වීමට තීරණය කර ඇත. එම එක් සංයෝජන වර්ගය වෙන වෙන ම ලියන්න.

අ) සීමා සහිත විදුර පිනැන්ස් සමාගම සහ සීමා සහිත වෙනුර පිනැන්ස් සමාගම.

ආ) සීමා සහිත දේශප්‍රිය රබර් වැව්ලි සමාගම සහ සීමා සහිත රන්දිව ටයර් නිෂ්පාදන සමාගම.

(ii) රටක ආර්ථික සංවර්ධනය උදෙසා සුළු හා මධ්‍ය පරිමාන ව්‍යාපාරවල දායකත්වය පැහැදිලි කරන්න.

(iii) ඒකක භාර සමාගමක ස්වභාවය හා කාර්යභාරය විස්තර කරන්න.

(iv) වාණිජ බැංකුවකින් ණය මුදලක් ලබා ගැනීමේ දී ගනුදෙනුකරුවෙකු විසින් සැලකිලිමත් විය යුතු කරුණු හතරක් සඳහන් කරන්න.

(v) අ) චෙක්පතක් රේඛනය කිරීම තුළින් ආරක්ෂාකාරීව ගෙවීමක් සිදු කළ හැකිය. පැහැදිලි කරන්න.

ආ) චෙක්පතක් ලිවීමේ දී සිදු කිරීමට ඉඩ ඇති වැරදි දෙකක් ලියන්න.

**(ලකුණු 4×5=20)**

**07.** (i) රක්ෂණ ගිවිසුමක් යනු කුමක් ද? එවැනි ගිවිසුමක් වලංගු වීමට පැවතිය යුතු මූලිකාංග මොනවාද?

(ii) ධනවර්ධන තේ සහ රබර් වතු කිහිපයක හිමිකරුවෙකි. තේ කර්මාන්ත ශාලාවක් ද ඔහු සතුය. සේවකයන්ට වැටුප් ගෙවීම සඳහා එම වතු සහ කර්මාන්ත ශාලාවට යාම ඔහුගේ පුරුද්දකි. ධනවර්ධන මුහුණ දෙනු ඇතැයි සිතිය හැකි අවදානම් හතරක් සහ එම අවදානම් වෙනුවෙන් ලබාගත හැකි රක්ෂණ ආවරණ හතරක් සඳහන් කරන්න.

(iii) "පාසලේ විදුහල්පති තුමා උදෑසන රැස්වීම අමතමින් වාර අවසාන විවිධ ප්‍රසංගය දෙසැම්බර් මස 01 දින පැවැත්වෙන බව ප්‍රකාශ කලේය. එවිට සියලු දෙනා අත්පොලසන් දෙන ලදී."

ඉහත සිද්ධියට අදාළව සන්නිවේදනයේ මූලිකාංග දක්වන්න.

(iv) සැපයුම් සේවා පද්ධති වර්ග නිදසුන් සහිතව විස්තර කරන්න.

(v) අ) නිදහස් අන්තර්ජාතික වෙළෙඳාමට ඇති බාධා හතරක් සඳහන් කරන්න.

ආ) නිදහස් අන්තර්ජාතික වෙළෙඳාම ප්‍රවර්ධනය කිරීම සඳහා පිහිටුවා ඇති අන්තර්ජාතික සංවිධාන මොනවාද?

**(ලකුණු 4×5=20)**

08. (i) කළමනාකරණයට අයත් මූලික කාර්යයන් නම් කර, ඒවා අතර සම්බන්ධය රූප සටහනකින් දක්වන්න.

(ii) රොබට් එල් කර්ට්ස්ට අනුව කළමනාකරුවෙකු විසින් ප්‍රගුණ කළ යුතු කුසලතා කෙටියෙන් පැහැදිලි කර, එම කුසලතා එක් එක් කළමනාකරණ මට්ටම් අනුව වැදගත්වන ආකාරය විස්තර කරන්න.

(iii) අ) සංවිධානයක අග්‍ර මට්ටමේ කළමනාකරුවන්ට අයත් කාර්යයන් දෙකක් ලියන්න.

ආ) නිවැරදි තීරණ ගැනීමක් සඳහා විකල්ප විසඳුම් සංවර්ධනය කළ යුත්තේ ඇයි?

(iv) අ) සැලසුම්කරණය යනු කුමක්දැයි නිර්වචනය කරන්න.

ආ) සැලසුම්කරණයේ වාසි දෙකක් සඳහන් කරන්න.

(v) කෙටියෙන් පැහැදිලි කරන්න.

ආ) කළමනාකරණ පාලනය

ආ) නියෝග දීමේ ඒකීයතාව

ඇ) පාලන අවකාශය

ඉ) බලය මධ්‍යගතකරණය

**(ලකුණු 4×5=20)**